සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - 2018
General Certificate of Education (Adv. Level) Examination, 2018

| | | | | |
|---|---|---|---|---|
| සිංහල I<br>rpq;fsk; I<br>Sinhala I | Richmond Collage<br>Galle | 71 | S | II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය

උපදෙස් :

* පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

01) පහත දැක්වෙන කොටස් ලිහිල් බසින් ලියන්න.

(අ) රළු දෙයක් සපා දුක සේ ගලන පරිද්දෙන් කිසිවක් කන්ට ආලයෙක් ඇතැ' යි කිවුය. 'කුමකට දැ' යි විචාළ කල්හි සිත් හා උනුත් ගෙන කබලුපූවකට යයි නැකත් වේලකින් කෙසිවිදට මහත් දෙයක් කෙසිවිදකින් අදනා කලක් පරිද්දෙන් දුක සේ කියාපීහ. සිටාණන්ගේ අදහස පටු වූවත් තමන්ගේ අදහස විශාරද හෙයින් 'ඇයි මෙවිතරක් කියන්ට මැළි වූයේ අසූකෙළක් වස්තු ඇතිවත් දුක්පත් හෙයින්ද? සියලු ම මේ සක්ඛර නම් නියම්ගම් ඇත්තවුන්ට සෑහෙන ලෙස කබලු පිසෙම් ද? යි

01. සිටුතුමාගේ පටු වූ අදහස කුමක් ද?
02. මෙහි දැක්වෙන පරිදි සිටුතුමාට කොපමණ වස්තුව තිබුණේ ද?
03. නියම් ගමෙහි නම කුමක් ද?
04. **"කෙසිවිද"**, **"රළු"** යන වචනවල අදහස ලියන්න.

(ලකුණු 04)

(ආ)

ඇතුළු කෙළවර සිටි ස්වර්ණ පර්වතය තෙම උසින් සත් යොදුන් පමණ වූයේ ය. සදත්විල වටකොට පාත්‍රමෝවිටක් මෙන් සිටියේය. ඒ පර්වතයාගේ ඇතුළු පිට ඝන රත්මය විය. එයින් නික්මුණු රත්වන් රැස්පතර හේතුකොට ගෙන සදත්විල තෙම හැම විටම නැංගාවූ ළහිරු මඬලක් මෙන් බබළන්නේය. ඉක්බිතිව සිටි පර්වතය තෙම උසින් සයොදුන් පමණ ඇත්තේ ය. තුන්වෙනි පර්වතය උසින් පස්යොදුන් පමණ උස ඇත්තේ ය. ඊට අනතුරු පර්වතය උසින් සතර යොදුන් පමණය. ඊට ඉක්බිති පර්වතය තුන් යොදුන් පමණය. ඊට ඉක්බිති පර්වතය දෙයොදුන් පමණය.

01. ස්වර්ණ පර්වතයේ උස කොපමණ ද?
02. ස්වර්ණ පර්වතය සකස් වූයේ කෙසේ ද?
03. මෙහි පර්වත කීයක් වේ ද?
04. **"ඝන රත්"**, **"පාත්‍රමෝවිටක්"** යන වචනවල අර්ථ පහදන්න.

(ලකුණු 04)

[ දෙවන පිටුව බලන්න

(ආ)

[illegible]

[illegible] ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, සුරාපානය [illegible] වූ අකුශල ධර්මයන් දුරුකොට ගෘහස්ථ ප්‍රව්‍රජිතාදී වූ ඒ ඒ භාවයට සුදුසු වූ කුශල ක්‍රියාවන් රැස්කළේ වී නම් එසේ වූ උත්තම සත්ත්ව තෙම බුදු පසේබුදු මහරහතන් විසින් පසන්නා ලද්දා වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ ශාන්ත වූ ප්‍රණීත වූ උතුම් වූ අමාමහ නිවන් පුරවත් පැමිණෙන්නාහු ම ය.

01. මෙහි දැක්වෙන ත්‍රිවිධ මදයන් මොනවා ද?

02. මෙහි දැක්වෙන අකුසල ධර්මයන් මොනවා ද?

03. "**නිවන**" මෙහි වර්ණනා කරන්නේ කෙසේ ද?

04. "**යෞවන මදය**", "**කුශල**" යන වචනවල අර්ථ පහදන්න.

(ලකුණු 04)

(ඇ) "සිය ගණනක් මෙසේ
රුදු රණ දිනා වෙසෙසේ
දැක් වී යස රැසේ
මහලු පැරකුම් නිරිඳු විලසේ"

---

"වැඳ ඔහු පද කමල
ලැබ සව් ඉසුරු මන කල
සොළි පඬි කේරළ
නොයෙක් නිරිඳෝ සිටිති ඈම කල"

1. රජුගේ කීර්තිය වැඩි වූයේ ඇයි?
2. රජුගේ කකුල් වැන්දේ කවර රටවලින් පැමිණි අය ද?
3. මෙහි රටවල් කීයක රජවරුන් පිළිබඳ කියවේ ද?
4. "**සිය ගණනක්**", "**සව් ඉසුරු**" යන වචනවල අර්ථ පහදන්න.

(ලකුණු 05)

(ඉ) පහත සඳහන් කොටස්වලින් **හතරක්** පිළිබඳ අවස්ථා සම්බන්ධය ලියන්න.

1. "වරෝ දරුවෙනි, තෙපගේ පියාණෝ කෙල සේ ගියෝ ය."
2. "මෙතැන්හි දිළිඳි දිළිඳි සිටින්නා වූ තෝ කවරෙක් දැ යි"
3. "[illegible] උපදවා [illegible] මැනැව්"
4. "මුල ඉඳල ම වේදනාව තදිං තිබුණ."
5. "නෑ කවදා ද ආයෙමත් එන්නේ."
6. "ඕ! මෝඩ කෙල්ල"

(ලකුණු 08)

[ තුන්වැනි ]ව බලන්න

[illegible] පහත සඳහන් පද්‍ය පන්තිය රසවින්දනය [illegible]න්න.

[illegible]

සමනොළ ගිරි පෙදෙසින් තෝ
මඳ සුළඟයි මේ එන් තේ
මගේ පුතා නිදියන් නේ

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒබ ව සිහි කොට මෙලො වේ
යුතු කම ඉටු කළ යුතු වේ

විජය තුමා තම්මැන් නේ
පිරිවර සෙත් සමඟින් තේ
සිටි සැටි දැන් සිහි වෙත් තේ
මගේ පුතා නැළවෙන් නේ

දෙන දිවි මුත් රට වෙනු වෙන්
ජාතික දරුවන් ලැබු වෙන්
මීදි නොයෙක් සතුරු මු වෙන්
ලක් මව් විසුවාය සු වෙන්

තවුසකු සේ ඇඳ පැල දා
පඬුවස් දෙව් මහ නිරි දා
මාකඳුරින් ගොඩ බට දා
මඟුලක් වී රට මුළු දා

දෙව් පුර මෙන් දෙවියන් නේ
සිරි ලක් දිව් බබළන් නේ
එහි සක් දෙව් රජු මෙන් නේ
මගේ පුතා ලොකු වෙන් නේ

ලස්සණ මෙන් මහ පොළො වේ
අනුරාපුර ඉදි කෙරු වේ
දොරමඬලේ කුමරිඳු වේ
උඹට පුතේ සුව එළ වේ

ජාතික රණ දෙරණ ම                    තේ
ගැටී වැටී මළ මොණඩාන                තේ
සුන්දර සුරඹුන්ගේ අ                     තේ
නැළවෙන බව සිතනු පූ                  තේ

සිරි මහ බෝ සිඹිමින්                   නේ
මහ මෙවුනා පෙදෙසින්                   නේ
සුළං දැලක් මෙන් එන්                    නේ
මුටසිව රජු සිහි වෙන්                   නේ

ලක් වැසියන් කෙරෙහි නැ               මී
අරහත් මහ මිහිඳු හි                      මී
පෙවුවෙ උතුම් සදහම්                    මී
පුත! නුඹටත් පොවමි එ                   මී

(ලකුණු 16)

02) "ජාතක කතා මිනිස් ජීවිතයේ පතුල ස්පර්ශ කරයි." මේ කියමන නියමිත **කථා දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න.

නැතහොත්,

"සද්ධර්මරත්නාවලිය භාෂා ලක්ෂණ අතින් අපූර්ව වූ බණ කථා පොතකි." නියමිත **කථා දෙකක්** ගෙන විමසන්න.

(ලකුණු 15)

03) "සමාජයේ සාමාන්‍ය මිනිසාට දාන, ශීල ආදී ගුණයන් පිළිබඳ හැඟීමක් ඇති කිරීමට අරමුණු කොට ගෙන සද්ධර්මලංකාරය දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචනා කොට තිබේ." මේ මතයට ඔබ එකඟ ද? ඔබේ පිළිතුර **කථා වස්තු දෙකක්** ගෙන පහදන්න.

(ලකුණු 15)

04) "ගිරා සන්දේශයේ එන තොටගමු වෙහෙර වැනුම පිළිබඳ සාර්ථක ඇගයීමක් කරන්න.

(ලකුණු 15)

05) "සමාජ ක්‍රමයේ සැබෑ තත්ත්වය පුතාගේ ශිෂ්‍යත්වය කෙටි කතාවෙන් නිරූපණය වේ." **සාකච්ඡා** කරන්න.

(ලකුණු 15)

06) "මළගිය ඇත්තෝ ප්‍රේම කතාවකට එහා ගිය කතාවකි" මේ මතය විවේචනය කරන්න.

(ලකුණු 15)

07) "නූතන කවියන්ගේ කවියේ අරමුණු සහ එහි පවත්නා මූලික **ලක්ෂණ** කවරේදැයි නියමිත පද්‍ය පන්ති තුනක් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

08) "මිනිස් සිත ගැඹුරින් විග්‍රහ කිරීම රත්නාවලී නාට්‍යයේ එන චරිත මගින් සිදු වේ." මේ මතයට පක්ෂව කරුණු ඉදිරිපත් කරන්න.

(ලකුණු 15)

සැකසුම: … ද සිල්වා

Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - 2018
General Certificate of Education (Adv. Level) Examination, 2018

සිංහල II
சிங்களம் II
Sinhala II

# Richmond Collage
## Galle
**13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය**

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

උපදෙස් :

ප්‍රශ්න අංක 1, 2, 3 ඇතුළු ව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01.

01. නූතනයේ සිංහලයේ භාවිතා නොවන අක්ෂර දෙකකි,
1. ඍ ඎ
2. ඏ ඐ
3. ඍ ඏ
4. ඞ ඏ
5. ඣ ඤ

( )

02. **ඝෝෂ අක්ෂර** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. බ, ද, ධ, ඪ, ඣ
2. ප, බ, ද, ධ, ඣ
3. ට, බ, ද, ප, ඣ
4. ක, ච, බ, ද, ප
5. ප, ක, ට, බ, ද

( )

03. **ආගම සන්ධියට** අයත් වචන යෙදී ඇති වරණය තෝරන්න.
1. දූප්පත්, වප්පිහිය, පිරියත්, මියඟුණ, අම්මල්
2. අල්ලස්, දූප්පත්, මියඟුණ, අම්මල්, පිරියත්
3. පිරියත්, මියඟුණ, තියුණු, වමත, නිරොද
4. පිරියත්, මියඟුණු, සිපියෙව්, දුවඟ, තුනුවඟ
5. නිරොද, තියුණු, තුනුවඟ, පිරියත්, මියඟුණු

04. **නිවැරදි ආකාරයෙන් සන්ධි වී ඇති** වරණය තෝරන්න.

1.
* සාධු + උක්ති = සාධූක්ති
* ගුරු + උත්තම = ගුරූත්තම
* පූර්ව + අපර = පූර්වාපර
* මහ + උදර = මහොදර

2.
* මහ + උදර = මහොදර
* පෘථිවි + ඊශ්වර = පෘථිවීශ්වර
* දේව + ආලය = දේවාලය
* ලංක + ඊශ්වර = ලංකේශ්වර

3.

- ✳ මහ + ඊශ්වර = මහේශ්වර
- ✳ ලංකා + ඊශ්වර = ලංකේශ්වර
- ✳ මුනි + ඊශ්වර = මුනීශ්වර
- ✳ විද්‍යා + ආලය = විද්‍යාලය

4.

- ✳ දයා + අනුකම්පා = දයානුකම්පා
- ✳ [illegible] + අර්ථ = ගුරුත්තම
- ✳ ප්‍රති + ඊක්ෂා = ප්‍රතීක්ෂා
- ✳ ජිහ්වා + ඉන්ද්‍රිය = ජිහ්වේන්ද්‍රිය

5.

- ✳ ධන + ඊශ්වර = ධනේශ්වර
- ✳ ජිහ්වා + ඉන්ද්‍රිය = ජිහ්වේන්ද්‍රිය
- ✳ මහා + ඊශ්වර = මහේෂ්වර
- ✳ ලංකා + ඊශ්වර = ලංකෙශ්වර

1. ද්විත්ත්වය, ආගමය, ලෝපය, ආදේශය
2. ලෝපය, ද්විත්ත්වය, ආගමය, ආදේශය
3. ආදේශය, ද්විත්ත්වය, ආගමය, ලෝපය
4. ලෝපය, ආදේශය, ද්විත්ත්වය, ආගමය
5. ආගමය, ලෝපය, ද්විත්ත්වය, ආදේශය,

( ______ )

05. **එකම සන්ධියකට අයත්** වචන යෙදී ඇති වරණය තෝරන්න.

1. පිනැති, නැණැති, සියැසින්, දකුණත, දිවැස්
2. ගමනාගමන, චූලෝදර, සුණුවම්, ගිනියම්, පල්ල
3. ගංරන්, තම්පලා, අඹවිල්, නෙළුම්වල්, මංමුළා
4. යද්දී, දුප්පත්, නාද්දී, අස්සන, කොග්ගල
5. දුග්ගන්නා, ලිග්ගල, සිත්තම්, වත්තම්, පල්ලෙව්

( ______ )

06. **ප්‍රථමා විභක්ති ඒක වචන හා ප්‍රථමා විභක්ති බහු වචන ප්‍රත්‍ය** යෙදී ඇති වරණය තෝරන්න.

1. ඕ, හු, ඇණ, අණු, අණි, උන්, අන්, න්
2. ඕ, හු, උන්, අන්, න්, එක්, අක්
3. ඕ, හු, උන්, අන් න්
4. ඕ, හු, එක්, අක්, එකු, උන්, අන්, න්
5. උන්, අන්, න්, ඕ, හු

( ______ )

07. **අට, ආට, උට, හට, ට** යන විභක්ති ප්‍රත්‍ය කවර විභක්තියකට අයත් වේද?

1. අවධි විභක්තිය
2. කර්ණ විභක්තිය
3. සම්බන්ධ විභක්තිය
4. ආධාර විභක්තිය
5. සම්ප්‍රදාන විභක්තිය

( ______ )

08.

- ✳ **නිල්අහස**
- ✳ **ඇයිහොඳය**

* **ගියපත්**
* **ඉමිසිපි** යන පද පිළිවෙළින් සමාස වී ඇති වරණය තෝරන්න.

1. විශේෂණ සමාසය, ද්කාරාර්ථ සමාසය, අන්‍යාර්ථ සමාසය, අව්‍ය සමාසය
2. අව්‍ය සමාසය, විශේෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, ද්කාරාර්ථ සමාසය
3. අව්‍ය සමාසය, විභක්ති සමාසය, ද්කාරාර්ථ සමාසය, අන්‍යාර්ථ සමාසය
4. විභක්ති සමාසය, අව්‍ය සමාසය, අන්‍යාර්ථ සමාසය, ද්කාරාර්ථ සමාසය,
5. විභක්ති සමාසය, ද්කාරාර්ථ සමාසය, අන්‍යාර්ථ සමාසය, ( )

09.

* **දැඹිදුරු**
* **සුන්තුරු**
* **දූන්වත්**
* **සඳවත්**

යන වචන කවර සමාසයකට අයත් වේද?

1. අව්‍ය සමාසය
2. විභක්ති සමාසය
3. විශේෂණ සමාසය
4. ද්කාරාර්ථ සමාසය
5. අන්‍යාර්ථ සමාසය ( )

10. **අක්ෂර වින්‍යාසය නිවැරදිව** යෙදී ඇති වරණය තෝරන්න.

1. පිළිම, සඟළ, ශ්‍රේෂ්ඨ, ඉෂ්ට, කනිෂ්ඨ, ඉහළ
2. පෞරුෂ, සෞන්දර්ය, පිළිම, ස්වභාවික, වෘත්තීය, මැණියෝ
3. ස්වාභාවික, මැණියෝ, පහල, ගැළපීම, පිළිවෙළ, ළිඳ
4. පහළ, ගැළපීම, උළෙළ, සියලු, බිළිඳු, පුරහල
5. පහල, ගැලපීම, උළෙල, සියළු, බිළිඳු, පුරහල ( )

11.

* **කර්කට**
* **කපාට**
* **දාඪ**
* **පටිකම්ම**
* **පටිමා**

යන වදන් පාලි, සංස්කෘතයෙන් බිඳී ආ වදන් ය. එය සිංහලයට පැමිණ ඇති ආකාරය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

1. කුකුළු, කවුළු, දළ, පිළියම්, පිළිම
2. කවුළු, කුකුළු, දළ, පිළිම, පිළියම්
3. දළ, කවුළු, කුකුළු, පිළිම, පිළියම්
4. කුකුළු, දළ, කවුළු, පිළිම, පිළියම්
5. පිළිම, කුකුළු, දළ, කවුළු, පිළියම්

( )

12. උක්ත ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි වාක්‍ය** තෝරන්න.

1. මණ්ඩලය රැස් වෙති.
2. ක්‍රීඩකයාත් ක්‍රීඩිකාවත් තරඟයට දුවයි.
3. ගංගාව ගලති.
4. පියා ද පුතා ද පන්සල් යයි.
5. මිනිස්සු සත්‍යකරුක විය යුතුය.

( )

13. උක්ත ආඛ්‍යාත සම්බන්ධය **වැරදි වාක්‍ය** තෝරන්න.
   1. ගමෙහි නායකයෝ ඇත.
   2. අපි වැඩි දෙනෙක් සාහිත්‍ය හදාරමු.
   3. මිනිස්සු බුද්ධිමත් වෙත් වා.
   4. ගුරුවරයා මම වෙමි.
   5. වැව් සැදූවෝ සිංහලයෝ ය.

( )

14. **පුතා** යන්නෙහි අනියමාර්ථ අනුක්ත රූපය නම් කරන්න.
   1. පුත්‍රු  2. පුතෙක්  3. පුතෙකු  4. පුතෙකුට  5. පුතුන්

( )

15. මෙසේ පැවැති අනතුරු ගී රැගුම් පුද
   කෙසේ සිසිත් වැඩ සිටි සුරවිමන් මැද
   **යසස් පතළ දිය සැළු උකුළු මන නද**
   ඇසේ පුරා දකු වඩිසණ සුරිඳු සඳ

   ඉහත තද කළු අකුරින් මුද්‍රිත පදයේ අර්ථය වනුයේ,
   1. උණුසුම් ජලය තුළ යස ඉසුරු හා මනා වූ නාදයන් පවත්වන
   2. ජලයට හා සංගීතයට අධිපති ව ලෝකයේ උපන්
   3. සිත් සතුටු කරන කීර්තිය ලෝකයේ පැතිරී උතුරා ගිය
   4. මනා ව කීර්තිය නැමැති නාදය ලෝකයේ පැතිර ගිය
   5. ජලයේ පවා කිමිදෙන කීර්තියක් සහිත බව

( )

16.
**උගා - පිහා**
**අලාභ - හානි** යනාදි යුගළ පද
   1. සමාන අර්ථයක් දෙන යුගළ පද වේ.
   2. නිශ්චිත අර්ථයක් නො දෙන යුගළ පද වේ.
   3. උපමා වාචී යුගළ පද වේ.
   4. විරුද්ධ අර්ථයක් දෙන යුගළ පද වේ.
   5. අනුප්‍රාසයෙන් යුත් යුගළ පද වේ.

( )

17. **"මුව දෙනවා"** යන රූඪී පදයෙහි අර්ථය වනුයේ,
   1. මුල්ලට වෙනවා
   2. රැස් වෙනවා
   3. ඉතා නිශ්ශබ්ද වෙනවා
   4. පැති මාරු වෙනවා
   5. ඉතා පැහැදීම

( )

18. **නොතාරිස්, රෝක්කල** ආදී පද සිංහලයට පැමිණියේ,
   1. ඕලන්ද බසෙනි.
   2. ඉංග්‍රීසි බසෙනි.
   3. පෘතුගීසි බසෙනි.
   4. ජාවක හා මැලේ බසෙනි.
   5. මාලදිවයින් බසෙනි.

( )

19. **උපජාත** යන පදයට නිවැරදි විරුද්ධාර්ථ තෝරන්න.
   1. නිපාත  2. සංයමය  3. අනුපජාත  4. විජාත  5. පක්ෂග්‍රාහී

( )

20. පහත දැක්වෙන වරණ අතුරින් **රූපකයක් නොවන්නේ**
   1. නුවණදැල  2. අමාබස්  3. මුවකමල  4. අමා වන් පල  5. පඬිරුවන

( )

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage

අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගය, 2018
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2018
General Certificate of Education (Adv. Level) Examination, 2018

සිංහල II
சிங்களம் II
Sinhala II

Richmond Collage
Galle

13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

උපදෙස් :

* I කොටසේ 01 ප්‍රශ්නය ද, II කොටසේ 02, 03 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

02. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුපිළිවෙළින් ලංකාවේ රාජධානි බවට පත් වූ පුරප්‍රවරයන්ගේ නම් අනුව සිංහල සාහිත්‍යය ද සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදේ. මේ යුග වෙන වෙන ම තුලනාත්මක පරීක්ෂණයට භාජන කිරීම මෙහි දී අවශ්‍ය නො වේ. එසේ වුව ද අනුරාධපුර යුගයට අයත් වන පද්‍ය සාහිත්‍යය වශයෙන් සීගිරි පවුරු ගී ද කාව්‍යාලංකාර ග්‍රන්ථයක් වන සියබස්ලකර ද හැර අන් කිසිදු කෘතියක් දක්නට නො ලැබෙන බව මෙහි දී සඳහන් කළ යුතු ය. සීගිරි ගීවල දක්නට ලැබෙන කාව්‍ය ආකෘති සිය පබැඳුම්හි යොදා ගත්තෝ විරලය හ. ඉනුදු අප දන්නේ පසු කාලයෙහි ඇති වූ කවීන් තිදෙනෙකු පමණි. ඔවුහු නම්, ගී කාව්‍ය නමින් ව්‍යවහාර ලැබූ ආඛ්‍යාන කාව්‍ය තුනෙහි කර්තෘවරු ය. කව්සිළුමිණ, සසදාවත, මුවදෙව්දාවත යන මේ කාව්‍ය තුන පරීක්සා කර බලන විට කවීන් තිදෙන ම සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනයෙහි ලා නොමඳ ව නියැලී ඇති බව හෙළි වෙයි. සංස්කෘත බලපෑමට නතු වූ ගී කාව්‍ය කර්තෘවරු දේශීය ලක්ෂණ විරල වූ ගතානුගතික කාව්‍ය වර්ණනා පබැඳූ හ. ඔවුහු ස්වභාව ධර්මය කෙරෙහි මහත් අභිරුචියක් දැක්වූ නමුත් ස්වකීය දේශීය පරිසරයෙහි දක්නට ලැබුණු ස්වභාව සෞන්දර්යයෙන් ප්‍රබෝධයක් ලැබූ බවක් සිය පබැඳුම්හි ස්ඵුට නො කරති. සංස්කෘත කාව්‍යයෙහි හමු වූ ප්‍රකාශන ක්‍රම සහ විවිධ අලංකාර රීති ද ඔවුහු ලැදි ව අනුගමනය කළ හ. රජුන්, රැජිනන්, නගර, උත්සව, ස්වභාව වස්තූන් ආදිය පිළිබඳ ඔවුන්ගේ අනේකවිධ වර්ණනා සියල්ල ම සම්පූර්ණයෙන් ම වාගේ ඒකාකාර ය. වෙනසක් පෙනෙන්නේ උපමා ඇතුළු අලංකරණ සකස් කර තිබෙන ආකාරයෙහි පමණි.

01. ගී කාව්‍යයන්හි ඒකාකාරීත්වය හා වෙනස්කම් මතුවන්නේ කවර අංග ආශ්‍රිතව ද?
02. ගී කාව්‍ය කතුවරුන් සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනය කළ බව තහවුරු වන්නේ කවර කරුණු නිසා ද?
03. සීගිරි ගී සහ සියබස්ලකර පිළිබඳ ව සඳහන් කිරීමෙන් ලේඛකයා තහවුරු කරන්නේ කුමක් ද?
04. මෙම ඡේදයේ සඳහන් අන්දමට සිංහල සාහිත්‍යය සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදා ඇත්තේ කුමක් පදනම් කරගෙන ද?
05. **පුරප්‍රවරයන්** හා **තුලනාත්මක** යන වචනවල අරුත් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් වන පරිදි සාරාංශ** කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නො දැක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අධ්‍යාපනය සමාජ වෙනස්වීම් සඳහා

සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තවද, ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද, නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් සහ ඇගයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කර ලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද, අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරා ම නායකත්වය පිළිබඳ විවිධ රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධනය හා සම්බන්ධ සමාජ සහ දේශපාලන සාධක දන්නා සැටියට ම, සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන ද දැන ගත යුත්තෝ ය.

අධ්‍යාපනය ශුභසාධන අංගයක් වශයෙන් නො ව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කර ගත යුතු ය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින් ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩගස්සා ගත යුතු බව යි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂකම් ඇතියවුන් නියත වශයෙන් ලබා දීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වූත්, විද්‍යාත්මක වූත් හැඟීමක් ඇතිකර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙ වැනි අවශ්‍යතාව ඉතා ම වැදගත් වෙයි. කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබාගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි.

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන **300-350 අතර වන සේ ව්‍යාකරණානුකූලව විශ්ලේෂණාත්මක රචනයක්** ලියන්න. (ලකුණු 15)

1. රටක සංවර්ධන ක්‍රියාවලියට බාධා පමුණුවන ස්වාභාවික විපත්ති
2. සාහිත්‍යාංගයක් වශයෙන් වර්තමාන ගීත ප්‍රබන්ධවල පවත්නා වැදගත්කම හා අනන්‍යතාව
3. වසංගත රෝග නිවාරණයෙහි ලා පොදු ජනතාවගේ කාර්යභාරය
4. ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධන ගමන්මඟ කෙරෙහි බලපෑම් ඇති කරන බලශක්ති අර්බුදය
5. ශ්‍රී ලංකාවේ පැරණි ජනජීවිතය හා බැඳුණු වාපි සංස්කෘතිය
6. කායික මානසික සමබරතාව කෙරෙහි ක්‍රීඩාව මඟින් ඇතිවන බලපෑම

04. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න. (ලකුණු 25)

1. මෙබඳු අපරාධ කවුරු හෙළා නො දකියි ද?
2. ගුරුතුමා විසින් අපි දක්නා ලදී.
3. තැන තැන පියුම් පොකුණු වූහ.
4. මා සින්දු කියද්දී ඇ අසා සිටියා ය.
5. දරුවන් දෙමවුපියන්ගේ උපදෙස් පිළිපදිත් නම් ඉතා අගනේ ය.

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්ම කාරකයට** හරවන්න. (ලකුණු 05)

1. රාජ්‍ය නායකයා විදේශ තානාපතිවරුන් සේවාවෙන් ඉවත් කරයි.
2. ප්‍රකට ගත්කතුවරු තම ග්‍රන්ථ රචනය සඳහා විවිධ භාෂා රීතීන් භාවිතයට ගත්හ.
3. සොර මුළු ළමයෙකු පැහැර ගත්හ.
4. විනිශ්චය මණ්ඩල සාමාජිකයෝ ගෞරව සම්මානයකින් මා පුදති.
5. හෙතෙම කතුරකින් කඩදාසි කොළ කැපුවේ ය.

(ඉ) නිවැරදි වාක්‍යයක් **නිර්මාණය** කිරීම සඳහා **සුදුසු** පදය වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 05)

1. පයින් (යන්නෝ / යන්නන්) දකුණු පසින් ගමන් කළ යුතු ය.
2. ඒ දුම්රියෙහි (කාන්තාවන් / කාන්තාවෝ) උදෙසා වෙන් වූ මැදිරියක් ඇත.
3. ලේකම්තුමා හෝ සභාපතිතුමිය හෝ ඒ රැස්වීමට සහභාගි (වන්නේ ය / වන්නී ය)

[ තුන්වැනි පිටුව බලන්න

4. (වචන්නෝ / වචන්නන්) දිනන්නෝ ය.
5. මාර්ටින් (වික්‍රමසිංහයෝ / වික්‍රමසිංහයන්) ගම්පෙරළිය රචනා කළහ.

05. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

1. බුදුරජාණන් වහන්සේ **ධරමාන** කාලයේ දී ම විවිධ ශාසනික විලෝපන සිදු විය.
2. **ඉච්ඡා භංගත්වයට** පත් තරුණ පිරිස් රට හැර යති.
3. **සමයසමයාන්තර ඥාන වර්ධනය** පිණිස ධර්ම ග්‍රන්ථ කියවීම අතිශයෝපකාරී ය.

(ලකුණු 03)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

1. රජකුගේ ඔටුනු පැළඳවීමේ උත්සවය
2. කැමති අදහස් ඉටු වීම
3. සිඳී - බිඳී විනාශ වූ දේ නැවත සකස් කිරීම

(ලකුණු 03)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන්** තෝරා ලියන්න.

1. සාහිත්‍ය රසවින්දනය හා විචාරය උදෙසා ........................ මාර්ගයක් වෙත අවතීර්ණ විය යුතු ය.
2. ප්‍රවීණ ගායකයා ........................................ වේදිකාව පසු පස හඹා යන්නෙක් නො වේ.
3. ලෝකයේ සමහර රටවල ........................................ ස්ථාවරත්වයක් නොමැති බව පෙනී යයි.
4. නළුනිළි කණ්ඩායම සහ ........................................ උද්දීප්තියට පත් කළහ.
5. චීනය හා ඉන්දියාව ආසියාවේ යෝධයන් සේ ........................................ සමෘද්ධියට පත්වෙමින් සිටියි.
6. සරාසඳ තරු රැස සමඟ උදා වී නුබ ........................ ආලෝකවත් කළේ ය.

**(ප්‍රබුද්ධ / දේශපාලන / ගර්භය / ප්‍රසිද්ධ / ගැබ / ආර්ථික)**

(ලකුණු 03)

(ඊ) **තද කළු අකුරින් ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

1. ඔහු කියත් **තල** රැගෙන ගෙන් - ගෙට ගොස් විකුණා ජීවත් විය.
2. හසිතිරාජයා තම **දළ** දෙකෙන් පර්වතයට ඇන්නේ ය.
3. **ගත** සිත සනසා ගනු පිණිස ඔහු භාවනාවට යොමු විය.
4. ගැහැනිය ගමට යනු **වස්** බස් රියට නැඟුණා ය.
5. අගෝස්තු **මස** 31 දින රජයේ නිවාඩු දවසකි.
6. මුවදෙව්දා **වත** බන්ධ කාව්‍යයකි.

(ලකුණු 06)

06. (අ) **තද කළු අකුරින්** දක්වා ඇති පද **කුමන ව්‍යාකරණ** අංගයකට අයත් දැ'යි දක්වන්න.

1. **දකුණතින්** ගත් කඩුව **ලෙලවමින්** ඔහු අති දක්ෂ **ලෙස** සටන් කළේ ය.
2. **ශ්‍රී ලාංකික පුවත්පත් කලාව වනාහි** තවතවත් සංවර්ධනය විය යුතු අංශයකි.
3. **පැරකුම්බාමහරජ වැව්අමුණු** තනා සහලින් රට **සමෘද්ධිමත්** කළේ ය.
4. **ගුණානුවණ** පිරි **ළමා පරපුරක්** බිහිකිරීම අධ්‍යාපන **අමාත්‍යාංශයේ** එක් සුවිශේෂ කාර්යයකි.
5. **වෙසක් පොහොය** නිමිත්තෙන් දර්ශනීය **තොරණක් ඉදිකර** ප්‍රදර්ශනය කරන ලදී.

(ලකුණු 03)

[ හතරවන පිටුව බලන්න

07. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන **ප්‍රස්තාව පිරුළ** ලියන්න.

1. කිසියම් වේදනාවක් ඇති කෙනකුට තවත් වේදනාවක් දීම.
2. වයසට හෝ තරාතිරමට හෝ නොගැළපෙන ක්‍රියාවක නිරත වීම.
3. ඉතා සුළු කරුණකින් පවා කිපීම.
4. මහන්සි වූ තරමට ප්‍රතිඵල නොලැබීම.
5. උදාර සේවයක් සිදුකොට අවසානයේ සුළු වරදක් කිරීම.
6. නිෂ්ඵල දෙයක් සඳහා මහන්සි වීම.

(ලකුණු 03)

(අ) පහත දී ඇති **රූඪීවල අදහස පැහැදිලි වන සේ** වාක්‍ය තනන්න.

| | | |
|---|---|---|
| 1. ජාඩියට මුඩිය වගේ | 2. ඉහවහා යාම | 3. උඩගෙඩි දීම |
| 4. අනූනවයෙන් බේරුණා | 5. දෙබරෙට ගල් ගැසීම | 6. වැල්වටාරම් දෙඩීම |

(ලකුණු 03)

(ඇ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

| | | |
|---|---|---|
| 1. උදව් - උපකාර | 2. රෙදි - පෙරෙදි | 3. වං - හුං |
| 4. ගොඩ - මඩ | 5. සොයා - බලා | 6. ඇඳුම් - ආයිත්තම් |

(ලකුණු 03)

(ඉ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| 1. වංගිය | 2. කටගහනවා | 3. පාරම්බාලවා |
| 4. හේලංකඩ | 5. පාරට්ටුව | 6. පැලපදියං වීම |

(ලකුණු 03)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| 1. අසානාසි වීම | 2. අඩුක්කු | 3. බැත |
| 4. අන්නම | 5. වඩ්දිය | 6. ආතුරයා |

(ලකුණු 03)

08. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උගතයුත්තක්වශයෙන්භාෂාවෙහිදඅන්තර්ගතයක්ඇතිබවත්වහරෙහිසදොස්නිදොස්උචිතඅනුචිත උසස්පහත්පවතිනබවත්පිළිගතමනායඒඅතුරින්නිදොස්වූත්උචිතවූත්උසස්වූත්ලක්ෂණසියවහරෙහි යොදන්නෝතමනටඇවසිනිරවුල්වූත්රසවත්වූත්බලවත්වූත්භාෂාරීතියක්නිෂ්පාදනයකරගතිතිසිංහලය උසස්සංස්කෘතියෙකවාහකයබවටපත්වූයේමෙයටදෙදහස්වසරකටදපෙරයවිෂයකවරක්වේවාඒපිළිබඳ අදහස්ප්‍රකාශකිරීමේමාධ්‍යයක්වශයෙන්කවරදාවුවසිංහලයදුබලතාවක්නොදැක්වීයදැනුදුනොදක්වයි වාක්කෝෂයඑහිලාප්‍රමාණවත්ය

01. ඉහත ඡේදයේ ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව **පද බෙදා** අවශ්‍ය **විරාම ලකුණු** යොදා නැවත ලියන්න.
02. **රකාරාංශය** සහිත **පද දෙකක්** ඡේදයෙන් උපුටා **දක්වන්න.**
03. **ඡේදයේ** සඳහන් **ගැට ඇලපිල්ල, යංශය** අන්තර්ගත වචන **දෙකක්** ලියා දක්වන්න.
04. ඡේදයේ ඇති "**අනුචිත**" යන **වචනයේ** අන්තර්ගත **පිල්ලම්** නම් කරන්න.
05. **රකාරාංශය**, හා **රේඵය** අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.

(ලකුණු 15)

සැකසුම: **සංජය ද සිල්වා**